රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 04/2013

මගේ අංකය:EST-9/DICIP/06/0195
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2013.12.06

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන්

**රටේ ඇති වී තිබූ තත්ත්වය හේතුවෙන් 1983 ජූලි මාසයට පසු රැකියා අහිමි වූ රජයේ නිලධාරීන්, පළාත් පාලන සේවයේ නිලධාරීන් සහ සංස්ථාවල සේවකයන්ට සහන ලබා දීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2006.02.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 04/2006 හා 2013.10.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 04/2006(I) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 04/2006(I) හි විධිවිධාන අනුව අභියාචනා ඉදිරිපත් කිරීමේදී, 1983 ජූලි මාසයට පූර්වාසන්නයේ සහ ඉන් පසු 2009.05.18 දින දක්වා රටේ පැවති අයහපත් තත්ත්වය හේතුකොට ගෙන රැකියා අහිමි වූවන්ට අභියාචනා ඉදිරිපත් කළ හැකි අතර ඉහත චක්‍රලේඛවල අනෙකුත් විධිවිධානයන්ට යටත්ව එම අභියාචනා සලකා බැලිය යුතුය.

පී.බී.අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය